'පට්ඨාන' ධර්ම දේශනා මාලාව - වීථිවාර
'අත්ථි ප්‍රත්‍යය' – 16.01.2020

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස

තුන්ලෝකාග්‍ර වූ අරිහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේම පරහිතකාමීව පාරමී ධර්මයන් සර්වප්‍රකාරයෙන්ම සම්පාදනය කොටගෙන ජයශ්‍රී මහා බෝධීන් වහන්සේගේ මූලයේ තමන් වහන්සේ තනියෙන්ම වැඩ ඉඳගෙන මාර පරාජයකොට ලොව්තුරා බුද්ධත්වයට පත්වී අතීතය අනාගතය වර්තමානය කියන කාලත්‍රයට සම්බන්ධ සියලුම ධර්මයන් දකින්නාවූ සර්වඥතාඥානයෙන් සමන්නාගත වූ ක්ලේශ ධර්මයන් නසන්නා වූ මහා ප්‍රඥාවකින් සමන්නාගත වූ සංසාරයෙන් මිදී නිර්වාණය කියන්නා වූ ශාන්ත ධර්මය අවබෝධ කොට ගත්තා වූ තමන් වහන්සේ විසින් අවබෝධ කරගත්තා වූ ඒ ප්‍රණීත ධර්මය ලෝකයාට කරුණාවෙන් දේශනා මාර්ගයෙන් ඒත්තු ගැන්වූවා වූ පැහැදිලි කොට වදාළා වූ සත්වයන්ගේ විමුක්තිය කැමති වන්නා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම මේ අවස්ථාවේදී සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ සන්තානයේ පහළ වී වදාළා වූ දැක අවබෝධකොට ගත්තා වූ සත්වයන්ට නිර්වාණ මාර්ගය පෙන්නන්නා වූ නිර්වාණ මාර්ගයට සත්වයෝ පමුණුවන්නා වූ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්මස්කන්ධයට ධර්ම රත්නයට මම නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ ධර්ම මාර්ගයේ ගමන්කොට ප්‍රණීත වූ සුන්දර වූ නිර්වාණ ධාතුවට පැමිණ වදාළා වූ අනන්ත අපරිමාණ ගුණ ඇති මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් ධම්ම රත්නයේ අනන්ත ගුණ බලයෙන් සංඝ රත්නයේ අනන්ත ගුණ බලයෙන් තුනුරුවන් සතු ගුණ සිහිපත්කොට වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අද මේ අවස්ථාවේදී අභිධර්ම සාකච්ඡාවට සූදානම් වී සිටින මේ පින්වත් සැම සියලු දෙනාටම මේ අවස්ථාවේදී කියාදෙන්න බලාපොරොත්තුවෙන ධර්ම කාරණා සියල්ල හොඳින් වැටහේවා! තේරේවා! අවබෝධ කරගන්න ලැබේවා! මේ ධර්ම කාරණා අසන කාලය තුල කිසිවෙකුගේ හිතකට නීවරණ ධර්මයන්ගෙන් බාධාවක් අත් නොවේවා! ක්ලේශයන්ගෙන් පීඩාවක් අත්නොවේවා! සිහිය අවධිකරගන්න හැකි වේවා! සමාධිගත සිතක් හදන්න හැකි වේවා! ප්‍රඥාව නුවණ අවධිකරගෙන විවර කරගෙන මේ ධර්ම කරුණු මනසිකාරයෙන් යුක්තව අසමින් සැමදෙනාටම මෙය ප්‍රතිපදාවක් කොටගෙන නිවන් අවබෝධ කරගන්න, නිවන් මාර්ගයේ යාගන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

අද සම්මත වශයෙන් අපිට අවුරුද්දක් උදා වෙලා තිබෙනවා. අද 2020 ජනවාරි මාසයේ 16 වෙනිදා. ඉතිං අද දවසේ අපි ගිය වර්ෂයේ යම්කිසි තැනක හමාර කළාද නැවැත්වූවාද ඒ ස්ථානයෙන් මෙහා පැත්තට තිබෙන ධර්ම කාරණා ටිකක් අවස්ථානුකූලව මේ පින්වතුන්ට සිහිපත් කරදෙනවා මතක් කර දෙනවා.

අපි අවුරුදු ගානක් තිස්සේ අභිධර්මය සාකච්ඡා කරගෙන ආවා. කථා කළා, කියෙව්වා, බණ ඇහුවා, කරුණු හොඳට තේරුම් ගන්න මහන්සි ගත්තා. අද ඒකෙ තවත් එක්තරා කොටසක්. අපි හැම දෙනාම මේ අලුත් අවුරුද්දේ සිහිපත් කරගන්න ඕනෑ, අධිෂ්ඨාන කරගන්න ඕනෑ, ප්‍රාර්ථනාවක් තබා ගන්න ඕනෑ, මෙන්න මේ විදියට. ප්‍රාර්ථනාව හොඳ නෑ කියලා කියනවා, හැබැයි මේ ප්‍රාර්ථනාව නොකර ඉන්න එක හොඳ නෑ කියන එක මගේ අදහසයි. ඒ තමයි අපි හැම කෙනාටම තුනුරුවන් කෙරෙහි නිවැරදි අවබෝධයකින් තුනුරුවන් කෙරෙහි නිවැරදි ශ්‍රද්ධාව පිහිටුවා ගත්ත තුනුරුවන් කෙරෙහි හොඳ ශ්‍රද්ධාවකින් හැසිරෙන ගැවසෙන කටයුතු කරන සත්පුරුෂ පුද්ගලයෝ හමුවේවා කියන ප්‍රාර්ථනාව අධිෂ්ඨානය අපිට තිබෙන්න ඕනෑ. ඒ සත්පුරුෂ ගුණවන්තයෝ දේශනා කරන ධර්මය

නිවැරදිව අහලා තේරුම් ගන්න අපිට ලැබේවා කියලා අධිෂ්ඨාන කරන්න ඕනෑ, ප්‍රාර්ථනා කරන්න ඕනෑ. ඒ ධර්ම මාර්ගයේ අපිට නිවැරදිව යාගන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරන්න ඕනෑ අධිෂ්ඨාන කරන්න ඕනෑ. ඒවගේම ධර්මය යනු කුමක්ද අධර්මය යනු කුමක්ද කියලා අසන පළමුවෙන වචන කාණ්ඩයෙන්ම තේරුම් ගැනීමට අපිට සිහිය නුවණ හැමවෙලාවේම අවධි වේවා, අපිට ප්‍රඥාව ඇතිවේවා කියලා ප්‍රාර්ථනාව පිහිටුවා ගන්න ඕනෑ.

එහෙම කියන්න හේතුව අද අපි මේ ස්කයිප් මාධ්‍ය හරහා මේ ධර්ම කථනය කරන්නේ. මේ පින්වතුන් එහා පැත්තේ ඉන්නේ. මම මෙහා පැත්තේ මේ දේශනාව කරන්නේ. මේ පින්වතුන්ට මාව පෙන්නේ නෑ. මට මේ පින්වතුන් පේන්නේ නෑ. නමුත් මම හැඟීමක් ඇතිකර ගන්නවා, විස්වාසයක් හදා ගන්නවා මම මේ කියන වචන ටික මේ පින්වතුන් ඔය පැත්තේ ඉඳලා අහනවා කියලා. මේ විදියට තවත් දේශකයාණන් වහන්සේලා ධර්මය දේශනා කරන්න පුළුවන්. නමුත් අද තිබෙන්නා වූ මාධ්‍ය හරහා මේ දේශනා වල් සිය ගණනක් නොවෙයි දහස් ගණනක් නොවෙයි මේ වෙනකොට ලක්ෂ ගණනක් තිබෙනවා. මේ දෙශනාවල් ඔක්කොම කෙනෙකුට අහන්න බෑ. නමුත් මේ දෙශ්නාවල්වල තිබෙන්නා වූ ධර්මමය ගතිය, ධර්මමය සාරය, ධර්මමය ගුණය අපිට ලැබෙනවා නම් හොඳයි. අනිත් එක තමයි එහෙම ධර්මමය සාරයක් තිබෙන දෙශනාවල් අපිට අහන්න, ඒවා ඒ විදියයි කියලා තේරුම් ගන්න නුවණ තිබෙන්න ඕනෑ. හේතුව මේ මාධ්‍ය ක්‍රමය නිසා ගොඩක් තිබෙන දේශනාවල් නිසා අපිට ප්‍රශ්න ඇතිවෙනවා මේවා තථාගතයන් වහන්සේගේ දේශනාවන්මද, තථාගතයන් වහන්සේගේ දේශනාවන්වලට ගැලපෙනවාද, තථාගතයන් වහන්සේගේ මූලික ධර්ම දේශනාවල් සමග ඒවා සැසඳෙනවාද කියන බව. ඒකනිසා මම මේ ප්‍රාර්ථනාව කරන්නේ මේ පින්වතුන්ට අනාථ අසරණ තත්වයට පත් නොවී සිහිය නුවණ අවධි කරගන්නයි. ඒක නිසා මේ පින්වතුන්ට මේ ධර්මයේ ආනුභාව බලයෙන් කිසිම අධර්ම කථනයක් අහන්න නොලැබේවා! අධර්ම භාෂණයට හිත නොනැමේවා! කියලා හැමවෙලාවෙම ප්‍රාර්ථනා කරනවා.

මේ උතුම් මිනිසත් භාවයට ලැබිලා තිබෙන රුවන්මය සම්පත තමයි බුද්ධ සාසනය. බුදුරජාණන්වහන්සේගේ සාසනයේ දේශනාව. ඒ දේශනාව අපි නිවැරදිව ඇහුවොත් සසර ගමන කෙළවර කරන්න පුළුවන්. එහෙම නැති උනොත් අපි බණ කියලා වෙනමොකක් හරි ඇහුවොත් අපේ සසර ගමන කෙටි වෙනවාට වඩා අපි අවුල්වෙලා අවුල්වෙලා නැවතත් මේකටම තමයි එක්කාසුවෙන්නේ. සසර අපි දික්ගස්ස ගන්නවා. මේ ටිකත් මේ පින්වතුන් හිතේ දරාගෙන අධිෂ්ඨානයක් ප්‍රාර්ථනාවක් හැටියට තබාගෙන සංසාර දුකින් මිදිලා යන්න අපිට මේ ධර්ම සාකච්ඡාව දේශනාව උපකාර වේවා කියන ප්‍රාර්ථනාව ඇතිකරගන්න. කල්‍යාණ මිත්‍රයෝ හැමදෙනාටම හැම තැනකදීම හමුවේවා, කල්‍යාණ මිත්‍රයන්ගේ කල්‍යාණ ධර්මය උතුම් වූ තථාගත ධර්මය අහන්න හිතන්න මෙනෙහි කරන්න අවස්ථාව සැලසේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඉතින් මේ කාලය තුල අපි මේ කථා කරගෙන යන්නේ අභිධර්මයේ නිතර කථා නොවෙන ධර්ම කාණ්ඩයක්. හැම තැනම කථා කරන්නේ නැති නිතර කථා කරන්නේ නැති අමාරුයි අපහසුයි කියලා නොසලකා හරින ලද ධර්ම කාණ්ඩයක්. ඒ තමයි අභිධර්මයේ එන **සූවිසි ප්‍රත්‍යය** විස්තරය. ඒක පට්ඨාන ධර්මය හැටියට තමයි මාතෘකා ගතවෙන්නේ. අපි දැන් අවුරුදු කීපයක් මේ ධර්ම සාකච්ඡාව ධර්ම විස්තරය මේ විදියට කරගෙන ආවා. ඉතින් අද මම මේ පින්වතුන්ට ඒ ප්‍රත්‍යය ධර්ම විස්තරයේ තවත් එක තැනක් මේ පින්වතුන්ට ඉස්මතු කරලා දෙනවා.

ප්‍රත්‍යය ධර්ම 24 න් අද අපි මේ පින්වතුන්ට මතක් කරනවා **අත්ථි ප්‍රත්‍යය - නත්ථි ප්‍රත්‍යය** කියලා විස්තරයක්. ඒකෙ ලොකු විස්තරයක් තිබෙනවා. ඒ උනාට මේ පින්වතුන්ට මේ කාරණය තේරුම් ගන්න පුළුවන් විදියට අපි මේකේ හැඳින්වීමක් කරනවා. **අත්ථි** කියලා කියන්නේ පාලි භාෂාවෙන් **තිබෙනවා** කියන එකයි. **නත්ථි** කියලා කියන්නේ **නෑ** කියන එක. එතකොට යම්කිසි ධර්මයක **තිබෙන බවට** කියනවා **අත්ථි** කියලා. ඒ ධර්මයේ **තිබීම** තවත් ධර්මයකට ප්‍රත්‍යය වෙනවා, හේතුවක් වෙනවා, ප්‍රධාන උපකාරයක් වෙනවා. එක ධර්මයක **තිබීම** තව ධර්මයකට උපකාරයක් වෙනවා. ඔන්න ඔය කථාවට කියනවා **අත්ථි ප්‍රත්‍යය** කියලා කියනවා. නමුත් මේ **අත්ථි ප්‍රත්‍යය** ගැන කියනකොට තිබෙන දේවල් ගොඩක් තිබෙනවා. ඒ තමයි ගෙවල් දොරවල් තිබෙනවා, ගස් කොළං තිබෙනවා, කඳු පර්වත තිබෙනවා, ඇල දොළ ගංගා තිබෙනවා. මේවා ඔක්කොම තිබෙනවා. ඒවගේම ආකාස ධාතුව

තිබෙනවා. එතකොට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා "මහණෙනි මම මේ දහම් මාර්ගයේ ගිහිල්ලා අවබෝධ කරගත්ත ධර්මයක් තිබෙනවා, ඒ තමයි නිර්වාණ ධර්මය. ඒ මම අවබෝධ කරගත්ත නිර්වාණ ධර්මය තිබෙන එකක්" කියලා. එතකොට නිර්වාණ ධර්මයත් තිබෙනවා. ආකාස ධාතුවත් තිබෙනවා. පඨවි ආපෝ තේජෝ වායෝ තිබෙනවා. ඇලදොළ ගංගා ගල් පර්වතත් තිබෙනවා. ගෙවල් දොරවලුත් තිබෙනවා. යාන වාහනත් තිබෙනවා. මේ දේවල් අතර හැම දේකම **තිබෙනවා - තිබෙනවා** කියන **ඇති බව** කියන්න පුළුවන්. එතකොට මේ තිබෙන දේවල් හැම දෙයක්ම අනිත් එකකට යම්කිසි උපකාරයක් වෙනවා කියන එක තමයි **අත්ථි ප්‍රත්‍යය** කියලා කියන්නේ.

දැන් මම මේ දක්වාම කිව්වේ මේකේ තේරුම. දැන් බලන්න, අපි පට්ඨාන ධර්ම සාකච්ඡාවේ ප්‍රත්‍යය ගැන සාකච්ඡා කරනකොට කල් ඇතුවම අපි ඉගෙන ගත්තා ධර්ම සමූහයක්. ඒ ධර්ම සමූහය ඉගෙන ගන්නේ නැතුව ප්‍රත්‍යය ගැන කථා කරන්න බෑ කියලා කිව්වා. ඒ මූලික ධර්ම අපි හොඳට ඉගෙන ගෙන දැනගෙන තිබෙන්න ඕනෑ, සිත කියන්නේ මොකක්ද - සිත් කීයක් තිබෙනවාද කියලා දැනගෙන තිබෙන්න ඕනෑ. සිත් 89 ගැන කථා කළා, මධ්‍යම ප්‍රමාණයට. ඊළඟට ඒ සිත් සමග බැඳී පොකුරු වී සහජාත වී එකට යෙදී පහළ වෙන චෛතසික ධර්ම 52 ගැන ඉගෙන ගත්තා. ඒවා වෙන වෙනම අපි සකච්ඡා කළා. ඒවා යෙදෙන විදියත් කිව්වා. ඊළඟට අපි කිව්වා සිතුත් නොවෙන චෛතසික ධර්මයන්ටත් අයිති නැති තරමක ඕලාරික රූප ධර්ම 28 ක් ගැන. ඊළඟට නිර්වාණ ධාතුව ගැනත් කෙටියෙන් සඳහනක් අපි ඇති කරගත්තා.

මේ ධර්ම සමූහය තමයි අපි බොහෝම සියුම්ම සියුම් විදියට තිබෙන ධර්ම හැටියට තේරුම් ගන්නේ. අභිධර්මයේ කථා කරන්නේ සාමාන්‍යයෙන් ඔන්න ඔය ධර්ම රාශිය. අපි කියනවා ඔතැන නිර්වාණ ධාතුවත් එක්ක ධර්ම 170 ක් තිබෙනවා කියලා. මේ ධර්ම 170 ආශ්‍රයෙන් තමයි අත්ථි ප්‍රත්‍යය ගැන කථාකරන්න වෙන්නේ. අත්ථි ප්‍රත්‍යය ගැන කථාකරන්න යනකොට මෙතැනදී පරෙස්සම් වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා දේශනා කරන මමත් අහන පින්වතුනුත්. ඒ තමයි **අත්ථි ප්‍රත්‍යය** භාවිතා කරන්නේ කොතැනටද කියලා. ඒ කියන්නේ මේ **තිබෙනවා** කියන බව. මේ ධර්ම වල සංඛත ධර්මත් තිබෙනවා අසංඛත ධර්මත් තිබෙනවා. මේ සංඛත ධර්ම කියන්නේ යම්කිසි ධර්මයක උපකාරයකින් හටගත්ත, හේතුවකින් හටගත්ත ධර්ම. ඒ තමයි සිත් - චෛතසික - රූප. මෙතැන තමයි **හේතු** සහ **ඵල** කියන්න පුළුවන් කම තිබෙන්නේ. නිර්වාණ ධාතුවට ඔය **හේතු ඵල** කථාව ගෙනියන්න බෑ. නිර්වාණ ධාතුවේ තිබෙන්නේ වෙනමම ධර්ම ස්වභාවයක්. ඒක නිසා මේ චිත්ත ගතිවල තිබෙන ගුණය චෛතසික ධර්ම වල තිබෙන ස්වභාවය රූපවල තිබෙන ස්වභාවය නිර්වාණයේ දකින්න බෑ. එතකොට මේ **තිබෙනවා (අත්ථි)** කියන ස්වභාවය ගත්තහම සංඛත ධර්ම වශයෙන් ක්‍රියාත්මක වෙන ධර්මත් තිබෙනවා. හේතුවකින් හටගන්නා ධර්ම වලත් **තිබෙන ගතිය** තිබෙනවා, පොඩි වෙලාවකට හරි. නිර්වාණ ධාතුවේත් තිබෙනවා, මේ **තිබෙන බව**. මේ **අත්ථි ප්‍රත්‍යය** භාවිතා කරන්නේ නිවනට නොවෙයි, චිත්ත චෛතසික රූප කියන ධර්ම සමූහයේ පමණයි. හේතුව, මේවා ඇතිවෙලා ටිකක් තිබිලා නැතිවෙලා යනවා. අන්න ඒකයි. මේ ධර්ම ඇති වෙලා පහළ වෙලා යම්කිසි වෙලාවක් තිබෙනවා. ඒක ක්ෂණයක් වෙන්න පුළුවන්, කොච්චරක් හරි කාලයක් තිබෙනවා. ඒ තිබෙන කාලය තුල තවත් එකකට ප්‍රත්‍යයක් වෙනවා. ඔන්න ඔය කථාව තමයි මේකෙන් කෙරෙන්නේ.

අපි උදාහරණයක් ගමු. අත්ථි කියලා කියන්නේ තිබෙනවා කියන එකයි. නැත්නම් විජ්ජති (විද්‍යාමාන වෙනවා) කියලත් කියනවා. හැම දෙයක්ම, සිතක් රූපයක් චෛතසිකයක් ගත්තහම ඒකෙ තිබෙනවා ලක්ෂණ තුනක්. සිතක් පහළ වෙනකොට කියනවා උත්පාදය කියලා - පවතින අවස්ථාවට කියනවා ඨිති කියලා - කැඩෙන අවස්ථාව භංගය කියලා. මේ උත්පාද - ඨිති - භංග කියන අවස්ථාව කොතන හරි තිබෙනවා නම් එතැන යමක් **තිබෙනවා.** ඒ කියන්නේ ඉපදෙන්න දෙයක් තිබෙන්න ඕනෑ. නැතිවෙන්න දෙයක් තිබෙන්න ඕනෑ. එතකොට ඒ උත්පාද - ඨිති - භංග කියන අවස්ථා තුනට පැමිණියා වූ මතු උනා වූ යම්කිසි ධර්මයක් තිබෙනවාද ඒ තමයි **තිබෙනවා** කියන ධර්මය. ඒ කියන්නේ වර්තමානය. මේ උත්පාද - ඨිති - භංග කියන අවස්ථා තුනේ තිබෙන ධර්මයෝ උත්පාද - ඨිති - භංග කියන ධර්මයෝ ඇසුරු කරන තවත් ධර්ම වලට උපකාරයක් කරනවා, ශක්තියක් වෙනවා. ඒවගේම supportive condition එකක් වෙනවා. ඒ තමයි සිත් චෛතසික සහ රූප. මේ ධර්ම

වලින් මොකක් හරි දෙයක් උත්පාද - ඨිති - භංග අවස්ථාවේ වැඩ කරනවා නම් ඒ වෙලාවේදී එය **තිබෙනවා.**

ඒ තිබෙනවා කියන ධර්මය තවත් එකකට උපකාර වෙන්නේ මෙහෙමයි. අපි ගමු ගොරෝසු උපමාවක්. ගහක් තිබෙනවා. ඒ ගහ තිබෙන නිසා තමයි ගහේ ඇතු හැදෙන්නේ, මල් හැදෙන්නේ සහ ගෙඩි හැදෙන්නේ. මේ අතු මල් ගෙඩි කොළ ආදී දේවල් හැදෙන්න ගහේ **තිබෙන බව** උදව්වෙනවා උපකාර වෙනවා. ඒක නිසා ගහේ විද්‍යාමාන ගතිය මලට ගෙඩියට කොළේට දළුවට උපකාරයි. එතකොට ගසේ තිබීම නිසා කොළ හැදෙනවා, ගෙඩි හැදෙනවා, මල් හැදෙනවා. ඕක තේරුම් ගන්න පුළුවන් මේ පින්වතුන්ට සීතල රටක ඉන්න හින්දා. මේ උපමාව ලංකාවට වඩා ඕලාරික විදියට පහසුවෙන් තේරුම් ගන්න පුළුවන් සීත රටවල. මේ සීත රටවල සමහර කාලෙට ගස්වල කොළ වැටෙනවා. කොළ වැටිලා ගහ පමණක් තිබෙනවා. ගහ තිබිලා සම්පූර්ණ කොළ ටිකයි මලුයි ගෙඩියි ඔක්කෝම හැලෙනවා. ඒ ගසේ තිබීම නිසා තමයි පස්සේ නැවතත් දළු දාල කොළ හැදිලා මල් පිපෙන්නේ. දැන් බලන්න දළු දාලා කොළ හැදිලා මල් හැදිලා ගෙඩි හැදෙන්නේ ඒ ගහේ තිබීම නිසා. ඒක නිසා ඒ ගස **අත්ථි ප්‍රත්‍යයයි.** ඒ ගසට තිබෙනවා **තිබීමේ** ශක්තිය. ඒ ගස **තිබෙන** ධර්මයක් හැටියට ඊළඟට පහළ වෙන ධර්මයකට උදව් වෙනවා. එතකොට ඒ උදව්ව ලබන්නේ කොළ මල් ගෙඩි දළු. මේවා තමයි **ප්‍රත්‍යය උප්පන්න** ධර්ම. ඒ ගහ නැත්නම් කොළ හැදෙන්නේ නෑ, දළු හැදෙන්නේ නෑ, මල් හැදෙන්නේ නෑ. ගෙඩි හැදෙන්නේ නෑ. ගහ තිබෙන නිසා තමයි කොළ හැදෙන්නේ, මල් හැදෙන්නේ, ගෙඩි හැදෙන්නේ, දළු හැදෙන්නේ. යම් කිසි දෙයක **තිබෙන කම** තමයි අනිත් එකට බලපෑවේ, උදව් උනේ උපකාර උනේ. මෙන්න මේ විදියටයි **අත්ථි ප්‍රත්‍යය** අපි තේරුම් ගන්නේ. ගහ නැති උනානම් කොළ හැදෙන්නේ නෑ, දළු හැදෙන්නේ නෑ, මල් හැදෙන්නේ නෑ, ගෙඩි හැදෙන්නේ නෑ, මොකක්වත් හැදෙන්නේ නෑ. මෙන්න මේ විදියට කාරණය තේරුම් ගන්න ඕනෑ.

තව එකක් තිබෙනවා. අපි කියනවා යමක් පරණ උනා කියලා. පරණ වෙනවා කියලා කියන එක එක්තරා සිදුවීමක්. අපි කියනවා වයසට යනවා, දිරා යනවා කියලා. ඒ පරණ වෙනවා දිරා යනවා කියන එක සිද්ධ වෙන්න දෙයක් **තිබෙන්න** ඕනෑ. දෙයක් තිබුණොත් තමයි ඒක පරණ වෙන්නේ, දිරා යන්නේ. එතකොට එහි **තිබීම** තමයි දිරා යාමට ප්‍රත්‍යය වෙන්නේ. එතකොට මෙතැන ප්‍රත්‍යය ධර්ම තිබෙනවා, ප්‍රත්‍යය උප්පන්න ධර්ම තිබෙනවා. දැන් මේ කථාව මේ පින්වතුන්ට මතක් කළේ **අත්ථි ප්‍රත්‍යය** හැටියට විශේෂයෙන් මෙතැන ගන්නේ නිර්වාණ ධාතුව නැතුව හේතු ඵල ධර්මයන්ට හසුවෙන හේතුඵල ධර්ම සමූහයේ වැඩ කරන චිත්ත චෛතසික රූප ධර්ම පමණක් බව.

ඇත්තවශයෙන්ම මේක කථා කරන කොට අපි ඉස්සෙල්ලා කථාකරපු මාතෘකා හතක් විතර කථා කරන්න ඕනෑ මේ ගැන හොඳ තේරුමක් ගන්න. අපි මුලින්ම කථා කළා මතක ඇති මේ පින්වතුන්ට හේතු - ආරම්මණ - අධිපති ආදී විදියට ප්‍රත්‍යය ධර්ම. ඊළඟට අපි කථා කළා සහජාත ප්‍රත්‍යය කියලා එකක්. ඒ ප්‍රත්‍යය ධර්මය මේකට සම්බන්ධ කරන්න ඕනෑ. තව වත්ථු වශයෙන් පුරේජාත වෙන විදිය කථා කළා. ඒක මේකට සම්බන්ධ කරන්න ඕනෑ. වත්ථු ආරම්මණ පුරේජාත කියලා කථා කළා. ඊළඟට පච්ඡාජාත කියලා කථා කළා, ආහාර කියලා ධර්මයක් කථා කළා, ඉන්ද්‍රිය කියලා ධර්මයක් කථා කළා. ඔන්න ඔය ධර්ම කරුණු හතම ගලපලා තවරලා ඒ කරුණුත් සමබන්ධ කරලා කථා කළොත් තමයි මේක හොඳට හොඳටම තේරෙන්නේ. අපි ඉදිරියේදී අවස්ථාව ලැබුණොත් දිගට කථා කරමු. මේ පින්වතුන්ට අලුත්ම අලුත් අවුරුද්දේ මේ කාරණය දැනගන්න ඕනෑ.

දැන් අපි මෙහෙම හිතමු. මේක උදහරණයක්. සම්මත වශයෙන් අපිට මතුවෙලා තිබෙනවා 2020 අලුත් අවුරුද්ද. ඇත්තටම කාලය කියන එක රබර් එකක් වගේ අල්ලන්න පුළුවන් එකකුත් නොවෙයි. ඒක රබර් එකක් වගේ ඇදෙන එකකුත් නොවෙයි. ඒක එක්තරා විදියක දෙයක්. නමුත් අපි සම්මත කරගෙන තිබෙනවා මේක අලුත් අවුරුද්දක් කියලා. දැන් 2020 අවුරුද්ද තිබෙන්නේ එහෙම එකක් අපි හදාගෙන තිබෙන නිසා. ඒක නිසා 'අලුත් අවුරුද්දක් වේවා' කියලා කියනවා. 'මේ අවුරුද්දේ මේ විදියට කරන්න ඕනෑ' කියලා තිබෙනවා. මේක හින්දා අපි ගොඩක් දේවල් කාලයට සම්බන්ධ කරලා කථා කරනවා. යමක් **තිබෙන** නිසා ඒ තිබෙන බව තමයි අනිත් එකට උපකාර වෙන්නේ. ඔය කාරණයයි අපි තේරුම් ගන්න ඕනෑ. මේක උදාහරණයක් පමණයි. කාලය කියන එක ප්‍රත්‍යය වෙනවා කියන එක නොවෙයි මේ කියන්නේ, නමුත් තිබෙන්නේ නාම ධර්ම වශයෙන් සිත් සහ චෛතසික

ධර්මත් රූප ධර්ම වශයෙන් රූප 28 පමණයි. ඒ ටිකයි අපි තේරුම් ගන්න ඕනෑ. මම විස්වාස කරනවා මම මේ කියාපු පුංචි කථනය මේ පින්වතුන්ට තරමකට හිතේ අවබෝධයක්, තේරුම් ගැනීමක් හැටියට තවරගන්න පුළුවන් උනා කියලා.

දැන් අපි මේ වගේ තැනකට යමු. මෙහෙම පාලි වාක්‍යයක් තිබෙනවා. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො** කියලා. ඒකේ සිංහල තේරුම අපි දැනගන්න ඕනෑ.

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො** = කුසල ධර්මය තවත් කුසල ධර්මයකට ප්‍රත්‍යය වෙනවා ඒක **තිබෙන බව** නිසා. සිතක් පහළ උනහම ඒ සිතේ **තිබෙන බව** අනිත් චෛතසික ධර්මයන්ට උදව් වෙනවා. ඒ වගේම තමයි චෛතසික ධර්ම කියන එක සිතට උදව්වෙනවා. සිත තිබුණේ නැත්නම් චෛතසිකයන්ට බෑ වැඩ කරන්න. චෛතසික නැත්නම් සිතට බෑ වැඩ කරන්න. ඔන්න ඔය විදියට ධර්ම ස්වභාවයක් තිබෙන නිසා තමයි තථාගත නුවණට, ආර්ය නුවණට, උතුම් නුවණට මේක වැටහී යන්නේ.

ඇත්ත වශයෙන්ම මේ ගැන කථා කරනකොට තවත් එකක් මතුවෙනවා. මෙච්චර සියුම් දෙයක් මෙච්චර පුංචි දෙයක් මේ මනුස්ස හිතකට දැනගන්න පුළුවන් වෙයිද. මේ ධර්ම කාණ්ඩය දෙවියන්ට දේශනා කළා, අපිට මේකෙන් ගන්න ඕනෑ මොකක්ද කියලා කෙනෙකුට ප්‍රශ්නයක් ඇතිවෙන්නත් පුළුවන්. මේ සියුම්ම සියුම් ධර්ම හොඳින්ම තේරුම් ගන්න ඕනෑ. මේ පින්වතුන් දැකලා ඇති සමහර පෑන්වල අකුරු ලියලා තිබෙනවා. Ballpoint පෑනකනම් සමාන්‍යයෙන් ඒකේ brand name එක company name එක ටිකක් ලොකුවට ලියලා තිබෙනවා. නමුත් සමහර පෑන් තිබෙනවා ඒ පෑනේ නම ලියලා තිබෙනවා කියලා පේන්නෙත් නෑ. ඒක අකුරක්ද නැත්නම් කුණු කැල්ලක් කෙස් ගහක් ඇකිලිලා නැමිලා තියෙනවද කියලා සැක හිතෙන තාලෙට සියුම් විදියට තිබෙනවා. මම දැකලා තිබෙනවා ඒ වගේ සමහර පෑන්වල පොඩියට කෙස් ගහක ප්‍රමාණයෙන් නම ලියලා තිබෙනවා. හැබැයි අකුරක් නෑ කියන්න බෑ. ඒක තිබෙනවා. ඒ තිබෙන නිසා තමයි මම මේ කියන්නේ. තිබෙන නිසා තමයි බැලුවේ. තිබෙන නිසා තමයි පෙනුණේ. නමුත් සම්පූර්ණයෙන් පැහැදිලිව පෙන්නේ නෑ කියන එක වෙන කථාවක්. ඒක තිබෙනවා කියන එක වෙන කථාවක්. ඒක තිබෙනවා. ඒ වගේ මේ ධර්ම වල යමයම් ගුණ ස්වභාවයෝ තිබෙනවා යම් යම් ක්‍රියාකාරී ස්වභාවයෝ තිබෙනවා හරිම සියුම්. හැබැයි නැත්තේ නෑ.

අපි මේක අමාරුයි අමාරුයි කියලා අතහැරලා පැත්තකට දාලා ගියොත් එහෙම අපි හැම වෙලාවේම සියුම් දේ තකන්නේ නැතුව හැම වෙලාවේම ඕලාරික දේවල්ම බල බල යනවා. ඒ නිසා අපි හදාගන්න ඕනෑ සිහිය නුවණ දියුණු කරන්න පුළුවන් ගතියක් තිබෙන හින්දා ඒක දියුණු කරන්න. දෙවිවරුන්ට දිව්‍යයක් ඥානය තිබෙන නිසා පුංචි පුංචි සියුම් ධර්ම බුදුරජාණන්වහන්සේ දේසනා කළා. හැබැයි මනුස්ස ප්‍රඥාවට ගන්න පුළුවන් ප්‍රමාණය අපිට දේශනා කළා. සැරියුත් ස්වාමීන්වහන්සේට දේශනා කළ ධර්ම කාණ්ඩය තමයි අපිට ඉතුරුවෙලා තිබෙන්නේ. දෙවිවරුන්ට දේශනා කරපු ධර්ම ඔක්කොම අපිට කියලා නෑ. එච්චර හරියක් කරගන්න අපිට බෑ. මනුස්ස හිතට බෑ. හැබැයි මාතෘකා ස්වරූපයෙන් කියපු ටිකක් තිබෙනවා. දැන්, යම්කිසි ධර්මයක් **තිබෙනවා** කියන එක තවත් ධර්මයකට උපකාර වෙනවා. ඒ උපකාරය ලබන්නා සහ උපකාරය කරන්නා කියලා ධර්මතා දෙකක් තිබෙනවා. **අත්ථි ප්‍රත්‍යය** කියලා කියන්නේ යම්කිසි ධර්මයක **තිබෙන** බව. ඒක හින්දයි අනිත් ධර්මයකට ප්‍රත්‍යයක් ලැබෙන්නේ.

තවත් එකක් තිබෙනවා මෙන්න මෙහෙම. මේක අපේ ජීවිතයේ අත්දකින්නට පුළුවන්. සමහර අවස්ථාවලදී හිඟි ජීවිතයක් ගතකරනකොට මෙන්න මේ වගේ හැඟීමක් ඇතිවෙනවා. ඒ තමයි අම්මයි තාත්තයි හරි එයින් එක්කනෙක් හරි ගෙදර ඉන්නකොට ඒක නිසාම අර ළමයින්ගේ හිතේ 'අම්මා ඉන්නවා, තාත්තා ඉන්නවා, අපිට ආරක්ෂාවක් තිබෙනවා' කියලා හැඟීමක් ඇතිවෙනවා. ඒ කියන්නේ අම්මෙයි තාත්ගෙයි ඉඳීම ඒ දරුවන්ගේ සැක සාංකාවල් නැති වෙන්න අමුතු උපකාරයක් වෙනවා. දරුවන්ට අම්මා තත්තා පේන්නේ නැති වෙන්න පුළුවන්. ඉන්නේ කාමරේක ඉන්නේ කුස්සියක වෙන්න පුළුවන්. හැබැයි ඒ අයගේ ඉඳීමම 'අපි පරෙස්සම්, අපිට පිහිටක් තිබෙනවා කියලා අමුතු තහවුරු වීමක් ඇති කරනවා. අන්න බලන්න අත්ථි ප්‍රත්‍යයේ තිබෙන අත්ථි ගතිය. අන්න ඒවගේ යම්කිසි දේකට චෛතසික ධර්ම හෝ රූප ධර්ම හෝ කුමක් හෝ වේවා ධර්මයකට යම්කිසි ධර්මයක් තියෙනවා කියන

එක ඒ ගොල්ලන්ගේ වැඩ ටික කරගන්න උපකාර වෙනවා. ඒ ගොල්ලන්ගේ ධර්මය ක්‍රියාත්මක කරන්න උදව් වෙනවා උපකාර වෙනවා.

අපි මේ කාරණය මේ විදියටත් තේරුම් ගනිමු. දැන්, මේ පින්වතුන් දන්නවා චෛතසික ධර්මයක් තිබෙනවා **ඵස්ස** කියලා. දැන් ඒ ඵස්සය කියන චෛතසික ධර්මයේ තිබීම නිසා තමයි ඒක ආරම්මණයට වැදිලා තිබෙන නිසා තමයි වේදනාවට අරමුණ විඳින්න පුළුවන්කම තිබෙන්නේ. එතකොට බලන්න ස්පර්ශය කියන චෛතසිකයේ තිබීම තමයි වේදනාව කියන චෛතසිකයේ ක්‍රියාත්මක වීමට උදව් වෙන්නේ = අත්ථි ප්‍රත්‍යය. අනිත් එක තමයි, **සිත** කියන ධර්මය තිබෙන නිසා තමයි ස්පර්ශයට වේදනාවට පහළ වෙන්න පුළුවන් කම තිබෙන්නේ. 'හිත' අත්ථි ප්‍රත්‍යයයි. ඒ ප්‍රත්‍යය ලබන්නේ චෛතසිකයි. ඔන්න ඔය විදියට තමයි යම්කිසි වෙලාවක ධර්ම රංචුවක් එකට පහළ වෙනවද ඒ ධර්ම රංචුව අනිත් ධර්මයක පැවැත්මට ක්‍රියාත්මක වීමට, වැඩීමට, මේරීමට උදව් වෙනවා, උපකාර වෙනවා.

තව විදියකට කියනවා මෙහෙම.

- **කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අත්ථිපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අත්ථිපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අත්ථිපච්චයෙන පච්චයො.**

කුසල එක ස්කන්ධයක් අනිත් තිබෙන වේදනා - සංඥා - සංඛාර යන කුසල ස්කන්ධ තුනට උදව්වෙනවා උපකාර වෙනවා. ස්කන්ධ තුනක් ධර්මතා එකකට උදව් වෙනවා. ස්කන්ධ දෙකක් තවත් ස්කන්ධ දෙකකට උදව් වෙනවා. ඔය විදියට ඔය හතර දෙනා ඔවුනොවුන්ට උදව් කරනවා. ඔය විදියට තමයි ඕක තේරුම් ගන්න ඕනෑ වෙන්නේ.

තවත් එකක් අපි බලමු.

- **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො – සහජාතං, පච්ඡාජාතං.**

කුසල ධර්මය කියලා කියන ධර්මය අව්‍යාකෘත ධර්ම වලට අතථි ප්‍රත්‍ය භාවයෙන් උදව් වෙනවා, සහජාත (එකට ඉපදීම් වශයෙන්) හෝ පච්ඡාජාත (පසුව උපන්නා වූ) ධර්මයන් වශයෙන් හෝ උදව් වෙනවා, උපකාර වෙනවා.

කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට උදව් වෙනවා. අපි බලමු මොකක්ද කියලා අව්‍යාකෘත කියලා කියන්නේ. අව්‍යාකෘත ධර්ම තිබෙනවා කීපයක්. එකක් තමයි **විපාක**. විපාකයට තවත් විපාකයක් හදන්න බෑ. ඒක නිසා විපාක අව්‍යාකෘතයි. ඊළඟට **ක්‍රියාව** අව්‍යාකෘතයක්. **රූප** කියන ඒවා අව්‍යාකෘත ධර්ම. නිර්වාණයත් අව්‍යාකෘතයක්. නමුත් මෙතැන ගන්නේ **විපාක ක්‍රියා සහ රූප** පමණයි. කුසල ධර්මයක් පහළ වෙනකොට එතැන රූප ධර්ම සමූහයකුත් පහළ වෙනවා. ඒ රූප ධර්ම ටික අව්‍යාකෘතයි. කුසල ධර්මයෝ ටිකේ **අතථි ප්‍රත්‍ය** භාවය තිබෙනවා. දැන් මේ විදියට එක ධර්මයක් තිබෙන නිසා තමයි අනිත් ධර්මයක් ක්‍රියාත්මක වෙන්නේ, අනිත් ධර්මයක් මෝරන්න පටන් ගන්නේ, අනිත් ධර්මයක් වැඩෙන්න පටන් ගන්නේ. ඔන්න ඔය කාරණය තමයි ඕකෙන් අපි තේරුම් ගන්න ඕනෑ වෙන්නේ.

තව එකක් තිබෙනවා. ඒ තමයි තුන් වෙනි වීථිය.

- **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අත්ථිපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අත්ථිපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අත්ථිපච්චයෙන පච්චයො.**

කුසල ධර්මයක්, ඒ කියන්නේ කුසල සිත් සහ චෛතසික ධර්මයෝ, කුසල වශයෙන් පවතින්නා වූත් අව්‍යාකෘත වශයෙන් පවතින්නා වූත් ධර්මයන්ට (චිත්ත චෛතසික ධර්මයන්ට සහ රූප ධර්මයන්ට) උදව් වෙනවා, උපකාර වෙනවා අත්ථි ප්‍රත්‍යය භාවයෙන්.

අපි හිතමු මෙහෙම. මේක මීට ඉස්සෙල්ලත් අපි කියවලා තිබෙනවා මේ පින්වතුන්ට. උපදින අවස්ථාවේදී එනම් අපි පිළිසිඳ ගන්න අවස්ථාවේදී ඇතිවෙන්නේ අව්‍යාකෘත ධර්මයක්. ඒ තමයි ප්‍රතිසන්ධි සිත. ඒ කියන්නේ ඉස්සරවෙලා සිද්ධ කරපු කුසලයක විපාකයක්. ඕකට කියනවා අව්‍යාකෘතයක් කියලා. ඔය අව්‍යාකෘතය එතැනදී පහළ වෙන අනිත් අව්‍යාකෘත වූ චෛතසික ධර්මයන්ටත් කර්මයෙන් හටගන්නා වූ අව්‍යාකෘත වූ රූපයන්ටයි උදව් වෙනවා. මේ රූප පහළ වෙන්නේ අර අව්‍යාකෘත ධර්මය එතැන ක්‍රියාත්මක වෙමින් තිබෙන නිසයි.

අකුසල සිතක් පහළ වෙනකොට එතැන අකුසල චෛතසික වැඩ කරනවා. විපාක සිතක් තිබෙන තැනක තමයි අව්‍යාකෘත වූ චෛතසික ධර්ම, රූප ධර්ම වැඩ කරන්නේ. කුසල සිතක් තිබෙන තැනක තමයි කුසල සිතේ චෛතසික ධර්ම වැඩ කරන්නේ. මේ විදියට කුසල ධර්මයක් කුසල ධර්මයට - අකුසල ධර්මයක් අකුසල ධර්මයට - අව්‍යාකෘතය අව්‍යාකෘතයට - කුසලයක් කුසලයටත් අව්‍යාකෘතයටත් දෙකටම අත්ථි භාවයෙන් ප්‍රත්‍යය වෙන විධි තිබෙනවා. මේ ගැන දිගට අපිට කථා කරන්න පුළුවන්.

ඊළඟට නත්ථි ප්‍රත්‍යය. නත්ථි කියලා කියන්නේ යමක් එතැන නෑ කියන එකයි. අත්ථි ප්‍රත්‍යයටම සම්බන්ධ කරලා ඒක තේරුම් ගන්න එක හොඳයි. යමක් තිබෙන නිසා යමක මේරීමකට පත්වෙනවා. යමක් නැත්නම් තව එකකට පිහිටන්න මතුවෙන්න ඒක උපකාර වෙනවා.

අපි මුලින් කිව්වා ගහක් තිබෙන නිසයි මුල් හැදෙන්නේ, මල් හැදෙන්නේ, ගෙඩි හැදෙන්නේ කියලා. එතකොට කොළ හැදීම මල් හැදීම ගෙඩි හැදීම ආදී දේවල් පහළ වෙන්නේ නෑ ක්‍රියාත්මක වෙන්නේ නෑ ගහ නැති උනානම්. ඒක නිසා ගසේ නැතිවීම අනිත් ධර්ම වල පැවැත්මට ක්‍රියාත්මක වීමට ඉඩක් නෑ. ගසේ නැති කමම අනිත් ඒවා නැතිවීමට හේතු වෙනවා.

මේකේ මෙන්න මෙහෙම එකක් තිබෙනවා. ඊළඟ අවස්ථාවේදීත් අපි කථා කරමු. මේක පට්ඨානයේ විස්තර කරන වීථි සංග්‍රහයේ තව ගොඩක් තිබෙනවා. මේක මහා විසාල පරාසයක තිබෙන්නා වූ ධර්ම කාණ්ඩයක්. හැබැයි අපි ඒක තේරුම් ගන්න ඕනෑ බාහිර ලෝකයේ තිබෙන්නා වූ ඕලාරික උපමා ආශ්‍රයෙන්. නැත්නම් මේ සියුම් ධර්ම අපිට තේරුම් ගන්න හේතු සාධක කරගන්න අමාරුවෙනවා. අපි මේ අලුත් අවුරුද්දේ උත්සාහ කරලා බලමු ගැඹුරු තැන් සරල විදියට ඒත්තු අරගෙන අපේ හිතට අවබෝධ කරගන්න. එක කථාවක් තමයි අපේ ඉන්ද්‍රිය ධර්මයන්ගෙන් එනම් ඇස කන නාසය දිව ශරීරය තිබෙන හින්දා තමයි අපිට ඔය චක්ඛු විඤ්ඤාණ ආදී දේවල් පහළ වෙන්නේ. එහෙම වෙන්නේ ඒවා තිබීම නිසයි. මේවා නැත්නම් චක්ඛු විඤ්ඤාණයක් පහළ වෙන්නෙත් නෑ, මොකක්වත් පහළ වෙන්නේ නෑ. ඒවගේම තමයි යම්කිසි සිතක් තිබිලා ඒක අයින් උනාට පස්සේ තමයි අනිත් එකට ඉඩ ඇරෙන්නේ. ඒක තිබෙනකොට වෙන එකකට පහළ වෙන්න පුළුවන් කමක් නෑ.

බුදුරජාණන්වහන්සේගේ දේශනාවේ තිබෙනවා දේශනා ක්‍රමයක්, ඒක සූත්‍ර වලත් තිබෙනවා. බුදුරජාණන්වහන්සේ එක ක්‍රමයකට යම්කිසි දෙයක් දේශනා කරලා ඊළඟට ඊට පොඩ්ඩක් වෙනස් කරලා ඒ කාරණයම වෙන පදයකින් වෙන ධර්ම විස්තරයකින් කියලා දෙනවා. ඒවගේ මේ පට්ඨානය විස්තර කරන්නේ බොහෝම සියුම් ධර්ම කාණ්ඩයක් නිසා මේ සියුම් ධර්ම කාණ්ඩයේ අත්ථි ප්‍රත්‍යයේ විග්‍රයක් තිබෙනවා, නත්ථි ප්‍රත්‍යයේ විග්‍රයක් තිබෙනවා. අවසානයේ තිබෙනවා විගත සහ අවිගත ප්‍රත්‍යය කියලා විග්‍රයක්. ඒක ඇත්ත වශයෙන්ම බැලූ බැල්මට අත්ථි - නත්ථි - විගත - අවිගත කියන ධර්මතා හතරම එක හැඩයක් ගන්නේ එකම ලක්ෂණයයි තිබෙන්නේ, වචන විතරක් වෙනස් විදියක් පේනවා. නමුත් මේකේ හිතන්න ඕන පොඩි තැනක් තිබෙනවා.

**අවිගත** කියලා කියන්නේ **'අහක් වෙලා නෑ' 'ඉවත් වෙලා නෑ'** කියන එකයි. **තියෙනවා** කියන බවයි **අයින් උනේ නෑ** කියන එකයි දෙකම සමානයි. අනිත් එක තමයි නත්ථි. **නත්ථි** කියන්නේ නෑ කියන එක. **විගත** කියන කියන්නේ අහක් වෙලා ගිහිල්ලා කියන එක. එතකොට මේ **නත්ථි** කියන **එකයි විගත** කියන එකයි සමාන ගතියක් තිබෙනවා. **අත්ථි** කියන එකයි **අවිගත** කියන එකෙයි සමාන ගතියක් තිබෙනවා. හැබැයි මිනිස්සුන්ගේ තිබෙන්නා වූ චින්තනය, ඒ ගොල්ලෝ හිතපු විදිය ඒ ගොල්ලෝ ගරු කරලා කථා කරන වචනය බුදුරජාණන්වහන්සේට හොඳට තේරෙනවා. ඒක නිසා තමයි බුදුරජාණන්වහන්සේ එකම ධර්ම කාරණය උනත් ළඟින් එක සමානව තියලා වචන වලින් කියලා

දුන්නේ. ඉතිං අපි ඉදිරියේදී චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය ප්‍රසාද ඒවාගේම වත්ථු රූපය ආධාර වෙලා සිත් පහළ වෙන සැටිත් කථා කරමු. එතකොට අපි 2020 අවුරුද්දේ ආරම්භක ධර්ම කථනයක් හැටියට තමයි මේ අත්ථි ප්‍රත්‍යය පිළිබඳව අපි මේ ඉදිරිපත් කරගත්තේ.

තව එකක් තිබෙනවා. දැන් අත්ථි ප්‍රත්‍යය මේ විදියටත් හිතන්න බලන්න අපේ මට්ටමෙන්. දැන් මේ පැත්තෙන් ධර්ම දේශනාවක් කරනවා. එතකොට සද්ද තිබෙනවා, ඒ ගැන හිතනවා. ධර්ම දේශනාවක් තිබෙන නිසා තමයි එහා පැත්තේ ඉන්නා වූ පින්වතුන්ට අහන්න පුළුවන් කම තිබෙන්නේ. එතකොට දේශනා කරන වචනය තිබීමේ හේතුව තමයි මේ පින්වතුන්ගේ ඇසීමේ කටයුත්තට උදව් වෙන්නේ. හැබැයි මේ දේශනාව නැත්නම් අහන්න දෙයක් නෑ. අහන්න බෑ. අන්න ඒ වගේ තමයි **අත්ථි ප්‍රත්‍යය** සහ **නත්ථි ප්‍රත්‍යය** අපි තේරුම් ගන්න ඕනෑ වෙන්නේ. ඉතින් මේකේ තව ගොඩක් අපි ඉස්සරහට කථා කරමු මේකේ මහා විසාල පරාසයක් තිබෙනවා.

තව එකක් තමයි අපිට කාලයක් අතහැරිලා තිබුණා. සාසනික කාරණා කටයුතු නිසාවෙන් අපේ කාලය මිඩංගු කරගන්න බැරි වීම නිසා පොඩි පොඩි ධර්ම කරුණු විස්තර කිරීමට අපේ සහභාගිත්වය අඩු උනා. ඒ උනත් අපේ පින්වතුන් බොහෝම ආදරයෙන් ගෞරවයෙන් ධර්ම මනසිකාරයට එක්කාසු වෙලා සිටියා කියන බව අපිට ආරංචි උනා. දැනගන්න ලැබුණා. ඉතින් මේ පින්වතුන්ට මේ කාලය ඉතාමත්ම හොඳ ධර්ම සමයක් වේවා කියලා මම මෛත්‍රියෙන් කරුණාවෙන් ප්‍රාර්ථනා කරනවා. ආශිර්වාද කරනවා. අපි හිතා ගනිමු, අවුරුද්දක් කියලා එකක් තිබෙනවා, මාස 12 ක් තිබෙනවා කියලා. ඒ මාස 12 තිබීම හේතුකරගෙන අපිට කුසල ධර්මයන් වඩන්න පුළුවන්කම තිබෙනවා. ඒක නිසා කුසල ධර්මයන් අපි දියුණු කරගන්නවා වඩා ගන්නවා මෝරවා ගන්නවා කාලය අපිට ප්‍රත්‍යය වෙනවා කියලා හිතා ගත්තහම හරි. ඒක අත්ථි ප්‍රත්‍යයයි.

අපි කාරණා කීපයක් කිව්වා. අපි අහලා තිබෙනවා වචනයක් උපස්තම්භනය කියලා. උපස්තම්භනය කියලා කියන්නේ යම්කිසි දෙයක් තිබෙනවා, ඒ තිබෙන දේ තවත් දේකට මෝරන්න, හැදෙන්න වැඩෙන්න, දියුණු වෙන්න උදව් වෙනවා කියන එකයි. ඔන්න ඔය වගේ සමාන ගතියක් තමයි **අත්ථි ප්‍රත්‍යය** භාවයේ තිබෙන්නේ.

ඒක නිසා අද දවසේ විසාල පිරිසක් මේකට ඇහුම්කන් දීගෙන ඉන්නවා. ඉතින් අපි ආශිර්වාද කරනවා. හැමදෙනාටම ගාම්භීර ධර්ම කාරණා තේරුම් අරගෙන වටහාගෙන හොඳට ඒ තුල මනසිකාරය පවත්වාගෙන මේ හේතුඵල ධර්ම සමුදායෙන් මිදිලා නිවනින් සැනසෙන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ඇත්ත වශයෙන්ම මේ ලෝකයේ අද කාලයේ අහන්න ලැබෙන දේවල් එක්ක බැලුවහම සසරේ තිබෙන්නා වූ දුක සංසාරයේ තිබෙන භයානකත්වය හරියට ගැඹුරින් තේරෙනවා වැටහෙනවා. අනාගතය ගැන කිසිම විස්වාසයක් අපිට තියන්න බෑ තියන්න හොඳත් නෑ. අනාගත භය කියලා සූත්‍ර කීපයක් බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා. ඒක නිසා අනාගතයේදී අපිට මේ වාගේ බණ අහන්න අවස්ථාවක් ලැබෙයිද කියලා භයක් ඇතිවෙනවා. අනාගතයේ අපිට මේවගේ ධර්ම සාකච්ඡාවල් කරන්න තරම් ශ්‍රද්ධාවක් තිබෙන ගැඹුරින් හිතන පිරිසක් ඉඳීවිද කියලා හරි භයක් ඇතිවෙනවා. ඒවගේම අනාගතයේදී අපිට මේ වගේ කියලා දෙන අය ඉඳියිද කියලා භයක් ඇතිවෙනවා. හිතන්න අවස්ථාවක් සැලසෙයිද කියලා භයක් ඇතිවෙනවා. තථාගතයන් වහන්සේගේ මේ දේසනාවල් අද අමුතු ස්වරූපයක් අරගෙන ඒවා වෙනත් වෙනත් හැඩ තලවලට යන හැඩයක් වගේ තියෙනවා. ඒක නිසා අපේ පින්වතුන් අධිෂ්ඨාන කරගන්න, තථාගතයන් වහන්සේගේ නියම ධර්මය ආරක්ෂා කරමින් ලෝකයට ඉතුරුකරන ගමන් ඒක රැක ගන්න ගමන් ඒකාන්තයෙන් මේ ධර්මය අහලා හිතලා මෙනෙහි කරලා සංසාර දුකෙන් මිදී යන්න අපි මහන්සි ගන්නවා කියන අධිෂ්ඨානයෙන් ප්‍රාර්ථනාව හදාගන්න. ඒ සඳහා මේ පින්වතුන්ට විදර්ශනාවට උපකාරවෙන්නා වූ ධර්ම කරුණු මේවා. විදර්ශනාවේ කියවෙන ලක්ෂණ තේරුම්ගන්න උදව්වෙන ධර්ම කරුණු මේවා. සත්වයෙක් නොවෙන පුද්ගලයෙක් ආත්මයක් ජීවයක් කෙනෙක් නොවෙන යම්කිසි ධර්ම ශක්ති ටිකක් මේ එකතැනකට ගොනුවෙලා ක්‍රියාත්මක වෙනවා. ඒ කොටස අපි සත්වයෙක් පුද්ගලයෙක් කියලා නොදන්නාකමට අවිද්‍යාවෙන් බාර අරගෙන තියනවා. අන්න ඒක අපි තේරුම් ගන්න ඕනෑ. ඒක නිසා මේ අභිධර්ම කථනය මේ සියුම් ධර්ම කාරණා අපිට ඒකාන්තයෙන්ම විදර්ශනා ඥානය

මුහුකුරවා ගන්න උදව් වෙනවා උපකාරවෙනවා. ඒ කටයුත්ත මේ අවුරුද්ද පුරාම හැමදෙනාටම සිද්ධ කරගෙන සංසාර දුකින් මිදිලා අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මම මේ වෙලාවේදී මෛත්‍රියෙන් කරුණාවෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

තව එකක් තමයි අපිට නම් මේ සංසාර භය හරියට තේරෙනවා. ඇත්ත වශයෙන්ම මේ පින්වතුන් ටික හරි මේ සසර දුකින් මිදිලා යනවා කියලා දැනෙනවා නම් හරිම සන්තෝසයක් දැනෙනවා. ඒ තරමටම දෘෂ්ඨී කාන්තාරයක් මේකේ තියෙන්නේ. දෘෂ්ඨී ගතවෙන්න හරි ලේසියෙන් පුළුවන්. සම්මා දිට්ඨිගත වෙන්න තමයි අමාරු. කොස් ගස් තිබෙනවා දෙල් ගස් තිබෙනවා පයින් ගස් තිබෙනවා රබර් ගස් තිබෙනවා ඔයගස් කිසිම දෙයක් ඇවිල්ලා බුද්ධ සාසනයට කිසිම හානියක් කරන්නේ නෑ. කොස්ගස් දෙල් ගස් එහෙමම තිබෙනවා. කටුගසක් උනත් හැදිච්ච තැන එහෙම්ම තිබෙනවා. කවදාකවත් මේ බුද්ධ සාසනයේ තිබෙන තථාගතයන් වහන්සේගේ ධර්මය මොකක්වත් එහෙට මෙහෙට කරන්නේ නෑ. හැබැයි කොතන හරි තැනක මේ ගහක් වගේ එහෙට මෙහෙට ඇවිදින කෙනෙකුගේ ඔළුව අස්සේ දෘෂ්ඨිය කියන දෙයක් තැවරිලා තිබෙනවා නම් අන්න ඒක අර දෙල් ගසට කොස් ගහට කටු ගහට වඩා භයානකයි. ඒ සිත් සංසාරයේ වැඩි හරියක් කරලා තිබෙන්නේ දෘෂ්ඨි හදපු එකයි. ඒ දෘෂ්ඨි නිසා මේ තථාගත පිරිසිදු ධර්මයට හානි සිද්ධ වෙනවා. ඒක නිසා සංසාරේ හරි භයානකයි. අපිට පිරිසිදු ධර්මය අහන්න ලැබුණ නිසා ඉක්මනට සසරින් මිදෙන්න. අපි පරක්කු උනොත් එහෙම අපි තව ගොඩක් හානි දායක පැත්තකට යනවා.

අපි පහුගිය කාලේ කැනඩාවට වැඩම කළා. අපේ ශ්‍රද්ධාවන්ත පින්වත් පිරිසගේ ඉතාමත් කැප වීමකින් සංවිධානය කරපු දහම් වැඩ සටහනකට. ඊළඟට ස්විට්සර්ලන්තයටත් වැඩම කළා ඒ පින්වතුන්ගේ දහම් වැඩ සටහනකට. එංගලන්තයේත් හරිම ශ්‍රද්ධාවෙන් පින්වත් පිරිස දහම් වැඩ සටහනක් හදලා තිබුණා. ඉතින් ඇත්ත වශයෙන්ම මම ගොඩක් සතුටු වෙනවා ඒ සැම තැනකදීම ගොඩක් ශ්‍රද්ධාවන්ත ධම්මකාමී පිරිස හමු උනා. මේ සවනට සිසිලස ධර්ම මාධ්‍ය ඔස්සේ අපි කලින් දේශනා කරපු විස්තර කරපු ඒ ධර්ම කරුණු අහලා ඒ අනුසාරයෙන් ධර්මය ඉගෙන ගන්න අය ලියා ගන්න අය කියවන අය ගොඩක් අපිට හම්බ උනා. ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. මම මෙහෙ ඉඳන් බණ කියන එක විතරයි කරන්නේ. අපේ පින්වත් ජයන්ත මහත්මයා ලලිත් දළුවත්ත මහත්මයාලා එකතු වෙලා internet ඒකට දානවා. ඒවා website වල රඳවලා තිබෙනවා. ඒක නිසා තමයි ඒ පින්වතුන් අහන්නේ. ජයන්ත මහත්මයා මේ පිරිස එක්කාසු කරගෙන වැඩ සටහන කරනවා. ඒකට අපේ බෘනෝ මහත්මයාත් එකතු වෙනවා. ඒක නිසා තමයි විසාල පිරිසකට ඒවගේ දහම් පරිසරයක් ලැබිලා තිබෙන්නේ. ඒක නිසා සවනට සිසිලස දහම් සභාවේ ඉන්න අපේ සංවිධායක පින්වත් මහත්වරු ගොඩක් සතුටුවෙන්න. අපි විතරක් අහනවා නොවෙයි, ලෝකයට අපි දැනුවත්ව හෝ නොදැනුවත්ව ධර්මය බෙදා දෙනවා කියන එක ගැන හිතලා. ඇත්තවශයෙන්ම මම ගිය හින්දා තමයි තේරුම් ගත්තේ මේ වැඩ සටහන් වලට මෙහෙම පිරිස එකතු වෙනවා නේද කියලා. මම සතුටු වෙනවා ඒ ගැන. මම මෙහෙන් දේශනාවක් කළා skype එක වහලා දැම්මා එච්චරයි. මේ පින්වතුන් ඒවා එහෙට මෙහෙට හසුරුවලා සිද්ධ කරන දහම් සේවාව මම හරියට පිං දීමෙන් අගේ කරනවා. තව තව කල්‍යාණ මිත්‍රයෝ එකතු කරගෙන තව තව ගැඹුරින් සූත්‍රද ගාථාද අභිධර්මයද හොඳට තේරුම් අරගෙන හිතන්න මෙනෙහි කරන්න හැම දෙනාටම ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අභිධර්මය ගැඹුරුයි හිතන්නේ නැති නිසා. හිතන්න හිතන්න ගැඹුරු දේවල් උඩට මතුවෙලා මතුවෙලා එනවා. මැණික් තිබෙන්නේ පතුලේ. උඩින් තිබෙන්නේ කළුගල් බොරළු. ඉතින් පතුලට ගිහිල්ලා හාරගෙන උඩට එනකොට මැණික් ගන්න පුළුවන්. ඒකත් හිතේ තියා ගන්න. අපි ආශිර්වාද කරනවා අපේ ධර්ම මණ්ඩලයේ සැමදෙනාටම මෙය නිවන් මාර්ගයක්ම වේවා! නිවනින්ම සැනසෙන්න ලැබේවා!

සාධූ! සාධූ! සාධූ!

<u>ජයන්ත මහත්මයා</u> - හොඳමයි ස්වාමීන්ස ඔබවහන්සේ අපි වෙනුවෙන් වසර හතක අටක කාලයක් පුරාම කාලය වෙහෙස නොබලා අපිට ලබාදෙන ධර්ම ඥානය ඒවගේම අපිට මේ මාර්ගය හෙළි පෙහෙළි කර දීම අපි ඉතාමත්ම අගේ කොට සළකනවා ස්වාමීන්ස. ඔබවහන්සේ නැවතත් 2020 වසරේ අපිට ආරම්භයක් ලබා දුන්නා. අපිට ඒකෙන් උනේ මහත් වූ සැනසිල්ලක්. ස්වාමීන්වහන්ස

එහෙනම් අද දවසට නියමිත සාකච්ඡාව මෙසේ නිමා කරමු. ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කිරීම ලෙස ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>සවාමීන්වහන්සේ</u> - හොඳයි පින්වත්නි අද අළුත් අවුරුද්දේ ආරම්භක දේශනාවක්. ඉතින් මේ පින්වතුන්ට තුනුරුවන් සතු අනන්ත ගුණ බලයෙන් මේ කාරණා හොඳින් තේරුම් ගන්න අහන්න කියවන්න ලැබේවා! තව තව ගැඹුරු පරාසයක හිතන්න ශක්තිය ලබේවා! අද මේ උපදවාගත්ත ධර්මය ඇසීමේ පින ධර්මය දෙසීමේ පින අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාට අනුමෝදන් කිරීම් වශයෙන් සෙත් ප්‍රාර්ථනා කරනවා. මේවා ආරම්භ කරලා අපිටත් ආරාධනා කරලා මේ කටයුතු කරගෙන යන්න ගොඩක් කැප වෙච්ච ඒ පින්වත් මහත්මයාට නිදුක් නිරෝගී සුව සම්පත් ලැබේවා අභිවර්ධනය වේවා! එතුමාගේ දැහැමි ප්‍රාර්ථනාවල් ඉෂ්ඨ වේවා! ගුණ වඩාගෙන පාරමී පුරාගෙන සසර දුකින් මිදී අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා පිං දීමෙන් ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ඒ පවුලේ සැම දෙනාටමත් ශාන්තියක් සැපයක් සැනසීමක් වේවා!

ඊළඟට අපේ මේ සම්බන්ධීකරණ කටයතු කරන ජයන්ත රත්නායක මහත්මයාටත් මේකට සම්බන්ධ වෙලා ඉන්න සැම සියලු දෙනාටම සැනසිල්ලක් යහපතක් වේවා! සියලු දෙනාටම මේ වර්ෂය තව තව ගැඹුරින් හොඳින් හිත හිතා මෙනෙහි කරගෙන ධර්ම කාරණා ටික ඉදිරියට අසමින් ගලාගෙන යන්න චිත්ත චෛතසික ධර්මයන්ගේ හැඩරුව දැනගන්න රූප ධර්මයන්ගේ හැඩරුව දැනගන්න ඒවා හොඳට අබෝධ කරගන්න නුවණ පහළ කරගන්න මෙය ධර්ම මාර්ගයක් වේවා! මේ ධර්ම මාර්ගයේ ගමන්කොට නාම රූප ධර්මයෝ ඉතාමත් හොඳින් වටහාගෙන ඒ නාම රූප ධර්මයන්ගේ අන්තර්ගත අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණය වටහාගෙන සසර දුකින් මිදිලා නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.